1879

16 JUN 2020

මගේ අංකය:-2/7/2/10
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
කුරුණෑගල,
2020/03/26.

1. ගොවි සංවිධාන නිලධාරීන්,
   නියෝජිත මහත්ම/ මහත්මීන්,
2. රාජ්‍ය අංශයේ හා ආයතන මට්ටමේ
   ආයතන ප්‍රධානීන්/ නිළධාරි මහත්ම මහත්මීන්,

2020 යල කන්න රැස්වීමේ වාර්තාව

වගා කාලසටහන හා පොදු තීන්දු ප්‍රකාශය - හක්වටුඔය මහා වාරි ව්‍යාපාරය - 2020/03/26.

1946 අංක 32 දරණ වාරිමාර්ග අඥාපනතේ සඳහන් පරිදි 1968 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග අඥාපනතේ 458 අධිකාරියෙහි 19 වැනි රෙගුලාසිය අනුව හක්වටුනාඔය මහාවාරි ව්‍යාපාරයේ 2020 යල කන්නයට අදාළ වගා කාලසටහන සැකසීම සහ පොදු තීන්දු ප්‍රකාශයක් සාකච්ඡා කොට අනුමත කරගැනීම සඳහා වූ කන්න රැස්වීම කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් ලේකම් ජී.ඒ.කිත්සිරි වන මාගේ ප්‍රධානත්වයෙන් හක්වටුනාඔය නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයීය රැස්වීම් ශාලාවේ දී 2020/03/26 දින පෙරවරු 10.00ට පවත්වන ලදී.

02. සහභාගීත්වය

මෙම රැස්වීමට රාජ්‍ය නිලධාරීන් දොළොස්දෙනෙක් සහ ගොවි සංවිධාන නිලධාරී හා ගොවි නියෝජිත මහත්ම මහත්මීන් විසිදෙනෙකු සහභාගී විය.

03. ප්‍රථමයෙන්ම ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් රැස්වීමට සහභාගී වූ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු සියළුම රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන්, ගොවි සංවිධාන නිලධාරීන් සහ ගොවි නියෝජිත මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් අනතුරුව අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා වෙත මූලාසනය භාරදෙන ලදී.

04. අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා මූලාසනය භාරගනිමින්, අද දින මෙම රැස්වීමට සහභාගී වූ සියළුම රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන්, ගොවි සංවිධාන නිලධාරීන් සහ ගොවි නියෝජිත මහත්ම මහත්මීන් පිළිගන්නා බවත්, මෙම දිනවල ලොවපුරා ව්‍යාප්තවෙමින් පවතින කොරෝනා වෛරසය හේතුවෙන් පුද්ගලයින් සමූහවීම තහනම්කොට පවතින වේලාවකදී වුවද 2020 යලකන්න රැස්වීම පැවැත්වීමට විශේෂ අවසරයක් ලද බවත්, දිස්ත්‍රික් ලේකම්තුමා නොවලැක්විය හැකි හේතුව මත මෙම රැස්වීමට එතුමා සහභාගී නොවූ බවත්, රැස්වීමේ අරමුණ වන්නේ, 2020 යල කන්නයේ පෙරකන්න රැස්වීමේදී ගන්නා ලද තීන්දු තීරණ හෝ සංශෝධනය කරන ලද තීරණ සාකච්ඡාසම්මත කරගැනීමට යෝජනා ස්ථිර කරගැනීම බවත්, පැහැදිළි කරමින් කන්නයේ ජල අවශ්‍යතාවය සපුරාලීම පිළිබඳ අදහස් දැක්වීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අවස්ථාව ලබාදෙන ලදී.

05. වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

ඉදිරිපත් කිරීම - ඉංජිනේරු සහකාරතුමිය - හිරියාල

අද දිනට ප්‍රධාන ජලාශයේ ජල මට්ටම අඩි 19ක් පවතින බවත්, එය අක්කර අඩි 13 070 ක් වන බවත්, මළ ධාරිතාවය වන අක්කර අඩි 3 022 ට අතිරික්තව ප්‍රයෝජනයට ගතහැකි ධාරිතාවය අක්කර අඩි 10048 ක් වන බවත්, එය දකුණු ඉවුර කුඹුරු ඉඩම් අක්කර 2000ක් වගාකිරීමට ප්‍රමාණවත්වන බවත්, බිම් සැකසීමේ කටයුතු සඳහා ජලය මුදාහැරයවිට ජලාශයේ ජල මට්ටම අඩි 12 කට බසින බවත්, එයින් ජලමුර නවයක් නිකුත්කිරීමේදී එක් මුරයක් අක්කර අඩි 560කට සීමාකිරීමට සිදුවන බවත් දැනුම්දෙන ලදී.

06. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

ඉදිරිපත් කිරීම - මූලස්ථාන කෘෂිකර්ම උපදේශක - රඹේ කලාපය

රටේ පවතින තත්වය හේතුවෙන් කෘෂිකර්මාන්ත කටයුතු පසුබැසීම සිදුවූවොත් ඉදිරියේදී ආහාර අර්බුදයකට මුහුණදීමට සිදුවන බවත්, ජලය සපයාගතහැකි සියලුම ඉඩම්වල අතිරේක බෝග වගාවක් හෝ සිදුකිරීම කාලෝචිතවන බවත්, බීජ වී ලබාගැනීමේදී, වී සහතික කිරීම සිදුකළත් සහකිකය නිකුත්කිරීමේ කටයුතු අඩාල වූ බවත්, නමුත් බීජ ගුණාත්මකබවින් යුක්ත බවත්, දැනට ඉල්ලීම් සිදුකර ඇති ගොවීන් සඳහා එළවළු බීජ ලබාදීමට හැකියාව පවතින බවත්, දැනුම්දෙන ලදී.

07. ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව.

ඉදිරිපත් කිරීම - ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිළධාරිතුමා - රඹේ

ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පොහොර ලබාදීමට පසුගිය කන්නවලදී මෙන්ම මැදිහත්ව කටයුතු කරන බව දන්වන ලදී.

08. ජාතික පොහොර ලේකම් කාර්යාලය

ඉදිරිපත් කිරීම- සහකාර අධ්‍යක්ෂකතුමා - කුරුණෑගල

මෙවර පොහොර නිකුත්කිරීම පෙර නිර්දේශයෙන් 5%ක් අඩුවෙන් මෙවර නොමිලේ සිදුකරන බවත්, එයට හේතුව කාබණික පොහොර භාවිතා කිරීමට ගොවීන්ට අවස්ථාව ලබාදීම බවත්, ඒවා ගොවීන් විසින් සපයාගැනීම සිදුකළයුතු බවත්, දන්වන ලදී.

09. පෙර කන්න රැස්වීමේ තීන්දු තීරණ දැන්වීම.

ඉදිරිපත් කිරීම - නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමා - හක්වටුනාඔය

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් (සංශෝධිත) 1969 අංක 48 දරණ වාරිමාර්ග අඥාපනතේ විධිවිධාන අනුව 2020/03/05 දින හක්වටුනාඔය නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලයේදී පවත්වන ලද හක්වටුනාඔය මහා වාරි ව්‍යාපාරයේ 2020 යල කන්නය සඳහා වූ යෝජිත වගා කාල සටහන.

අනු අංකය	කාරණය	තීන්දුව
1.	වගා කරනු ලබන බිම් ප්‍රමාණය	දකුණු ඉවුර අක්කර 2703 (ජලාශයට අයි 23 ආවොත් ඉවුරු දෙකම)
2.	වගා කරනු ලබන බෝගය	මාස 3 , 3 ½ වී සහ වෙනත් බෝග
3.	ජලාශයේ ජලය නිකුත්කිරීම	2020/03/23
4.	ඇළ වේළි ශුද්ධ කිරීම ප්‍රධාන ඇළ (වාරිමාර්ග දෙපා: මඟින්) බෙදුම් ඇළ (ගොවි සංවිධානය මඟින්) කෙත් ඇළ (ගොවීන් විසින්)	 2020/03/25 ට පෙර 2020/03/25 ට පෙර 2020/03/20 ට පෙර
5.	ශුද්ධ නොකරන ලද ඇළවේළි ශුද්ධ කිරීම	2020/03/25 ට පෙර (ගොවි සංවිධාන අරමුදල් යොදා)
6.	වගා කටයුතු ආරම්භ කිරීම	2020/03/25 සිට
7.	වගාව පිහිටුවා අවසන් කිරීම	2020/04/12 ට පෙර
8.	මුර ජලය නිකුත් කිරීම	2020/04/14
9.	වගාව සඳහා ජලය නිකුත් කිරීම අවසන් කිරීම	2020/07/20
10.	වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය	2020/04/12
11.	වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය	හානි වී දින14 ක් ඇතුළත
12.	අස්වනු නෙළා අවසන් කළයුතු දිනය	2020/08/15 ට පෙර

1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග අඥාපනතේ II වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති.

1. කෙත් ඇළ සහ බෙදුම් ඇළ නඩත්තුව සඳහා අක්කරයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.
2. නියමිත දිනට බෙදුම් ඇළ සහ කෙත් ඇළෙහි තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.
3. ගවයන් වගා බිම් වලට අනවසරයෙන් ඇතුළත් කිරීම හා වගා පාලු කිරීමේ දඩය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව.
4. වාරි නිර්මිතවලට හානි කිරීම හා අනවසරයෙන් බට දැමීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව.

ඉහත 2020 යල කන්නය සඳහා පෙර කන්න රැස්වීමේ දී ගන්නා ලද තීන්දු තීරණ හා නීති රීති සුදුසු බවට දකුණු ඉවුර යාය 3 සී 8 සියඹලාවැව බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපති විසින් යෝජනා කරන ලද අතර, වම් ඉවුර සී 4 ට්‍රැක් 07 තම්බුව බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපති විසින් එය ස්ථිර කරන ලදි.

10. 2020 යල කන්නයේ වගා තීන්දු තීරණය කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධානවල/ආයතනවල අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම.

I. වම් ඉවුර ඩී 6 වදුරස්ස බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති - මාර්තු 28 දින කිරි උතුරවා අනතුරුව දකුණු ඉවුර සොරොව්ව විවෘත්ත කිරීම සුදුසුබව පවසනලදී.

II. වාරිමාර්ග ඉංජිනේරු සහකාරතුමිය - මාර්තු 28 බිම් සකස්කිරීමට ජලය නිකුත්කළවිට වගාව පිහිටුවා අවසන්කරන විට ප්‍රධාන ජලාශයේ ජල මට්ටම අඩි 12 ට බඹින බැවින්, ඇලවල් මැනවින් සුද්දකර මනා ජල කළමනාකරණයක් පවත්වාගතයුතු බවත්, තවදුරටත් සාකච්ඡාකොට වඩාත් සුදුසුම තීරණය ගන්නා ලෙසත් දන්වන ලදී.

III. වම් ඉවුර ඩී 1 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති - කන්නය ආරම්භ කිරීමට වර්ෂාපතනය ලැබෙනතෙක් ප්‍රමාද කොට 2020/04/20 පමණ ජලය නිකුත්කිරීම සුදුසුබව බවට අදහස් දක්වන ලදී.

IV. දකුණු ඉවුර යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු ලේකම් - දැනට දකුණු ඉවුරේ වගාව ප්‍රධාන ජලාශයේ ජලයෙන් පටන්ගැනීම වඩාත් සුදුසු බවත් ඉදිරියට වැසි ලැබෙනබව අත්දැකීම් අනුව දන්නා බව පවසන ලදී.

V. වම් ඉවුර ඩී 1 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික - රටේ පවතින තත්ත්වය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැක්වූ කරුණු සැලකිල්ලට ගෙන වගාකටයුතු ප්‍රමාද කිරීම සුදුසුබව දන්වන ලදී.

VI. දකුණු ඉවුර යාය 7 ඇනිකටිඇළ බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති - වගාකටයුතු ආරම්භ කිරීමට තම ගොවි සංවිධානයට ජලය අවැසි නොවන බවත්, අපත්වන ජලය දැනට ප්‍රමාණවත් බවත් දන්වන ලදී.

VII. වම් ඉවුර ඩී 4 බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති - කුඹුරු ඉඩම්වල කරන අතිරේක බෝග වගාවට පොහොර නිර්දේශය ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. එයට පිළිතුරු ලෙස පොහොර ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂතුමා - කුඹුරු ඉඩම්වල කරන අතිරේක බෝග වගාවට පොහොර නිර්දේශය නොමිලේ ලබාදෙන බව දන්වන ලදී.

11. 2020 යල කන්නය සඳහා වගා කාලසටහනක් හා පොදු තීන්දු තීරණ ප්‍රකාශයක් පිළියෙළ කිරීම.

අනු අංකය	කාරණය	තීන්දුව
1	වගා කරනු ලබන බිම් ප්‍රමාණය	අක්කර 2703 දකුණු ඉවුර යාය 1 සිට යාය 7 දක්වා (වාරි ජලයෙන්)
2	වගා කරනු ලබන බෝගය	මාස 3 , 3 ½ වී සහ වෙනත් අතිරේක බෝග
3	වගාව ආරම්භ කිරීම	2020/03/28

4	ඇළ වේළී ශුද්ධ කිරීම:- ප්‍රධාන ඇළ (වාරිමාර්ග දෙපා: මඟින්) බෙදුම්ඇළ (ගොවිසංවිධානය මඟින්) කෙත් ඇළ (ගොවීන් විසින්)	පෙර කන්න රැස්වීමේ තීන්දු තීරණ
5	ශුද්ධ නොකරන ලද ඇළවේළි ශුද්ධ කිරීම(ගොවි සංවිධාන අරමුදල් යොදා)	පෙර කන්න රැස්වීමේ තීන්දු තීරණ
6	වගා කටයුතු ආරම්භ කිරීම	2020/03/28 සිට
7	වගාව පිහිටුවා අවසන් කිරීම	2020/04/12 ට පෙර
8	මුර ජලය නිකුත් කිරීම	2020/04/15 සිට
9	වගාව සඳහා ජලය නිකුත් කිරීම අවසන් කිරීම	2020/07/20
10	වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය	2020/04/12 ට පෙර
11	වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය	හානී වී දින14 ක් ඇතුළත
12	අස්වනු නෙළා අවසන් කළයුතු දිනය	2020/08/20 ට පෙර

විශේෂ කරුණු :-

අනෙකුත් තීන්දු තීරණ පෙරකන්න රැස්වීමේ තීන්දු තීරණ බලාත්මක බව තීරණය කරන ලදී.

1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග අඥා පනතේ II වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති.

1.කෙත් ඇළ සහ බෙදුම් ඇළ නඩත්තු සඳහා අක්කරයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

2.නියමිත දිනට බෙදුම් ඇළ සහ කෙත් ඇළෙහි තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

3.ගවයන් වගා බිම් වලට අනවසරයෙන් ඇතුළත් කිරීම හා වගා පාලු කිරීමේ දඩය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව

4.වාරි නිර්මිත වලට හානි කිරීම හා අනවසරයෙන් බට දැමීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව

ඉහත 2020 යල කන්නය සඳහා කන්න රැස්වීමේ දී ගන්නා ලද තීන්දු තීරණ හා නීති රීති සුදුසු බවත්, වගාව පිහිටුවා යම්කිසි අවධානමක් දැරීමට සිදුවූවහොත් එහි වගකීම දකුණු ඉවුර ගොවිසංවිධාන විසින් බාරගන්නා බවත්,එම නිසා දකුණු ඉවුර සම්පූර්ණයෙන්ම යාය 1 සිට යාය 7 දක්වා වගාකිරීමට දකුණු ඉවුර යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර , දකුණු ඉවුර යාය 6 ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා විසින් එය ස්ථිර කරන ලදි.

13. <u>අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමාගේ මූලාසන කතාව</u>

දුෂ්කරතා රාශියක් මැද කැපවීමෙන් වැඩකරන රාජයේ නිළධාරීන්ට තමා ස්තුතිවන්ත වන බවත්, ඉදිරියේදී රටේ තත්ත්වය යහපත්අතට පත්වන තුරු ප්‍රවේසමෙන් කටයුතු කරන ලෙස පැමිණ සිටින සැමදෙනාගෙන් ඉල්ලාසිටින බවත් 2020 යල කන්නය කන්න රැස්වීමේ දී ගන්නා ලද තීන්දු තීරණ සංශෝධනය කිරීමට සිදුවූවහොත් ව්‍යාපාර කමිටුවට බලය පවරන

බවත්, කන්නයේදී වැඩි අස්වැන්නක් ලැබීමෙන් ගොවි ජනතාවගේ ආර්ථික හැකියාව දියුණුවන තත්ත්වයක් උදාවීමට කළ සුභපැතීමත් සමඟින් මූලාසන කතාව අවසන් කරන ලදී.

14. <u>ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති තුමාගේ ස්තුති කතාව.</u>

කන්න රැස්වීමට සම්බන්ධ වූ අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු පැමිණ සිටි රජයේ නිලධාරී මහත්ම මහත්මීන් සියළු දෙනාටත්, සම්බන්ධ වූ ගොවි සංවිධාන නිලධාරී මහත්ම මහත්මීන්ටත් ගොවි නියෝජිත පිරිසටත් හක්වටුනාඔය ව්‍යාපාරයේ ගොවි ජනතාව වෙනුවෙන් ගෞරවනීය ස්තුතිය ඵලකරමින් කන්න රැස්වීමේ කටයුතු නිමකරන ලදී.

.....,
ජී.ඒ.කිත්සිරි,
අතිරේක දිසාපති/අතිරේක දිස්ත්‍රික් ලේකම්,
කුරුණෑගල.

ජී.ඒ. කිත්සිරි
අතිරේක දිස්ත්‍රික් ලේකම් (සංවර්ධන)
දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල වෙනුවට

පිටපත්:-.

1. අධ්‍යක්ෂතුමිය - වරිමාර්ග කළමණාකරන අංශය-කොළඹ (කා.දැ.පි)
2. නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්තුමා-කුරුණෑගල(කා.දැ.පි)
3. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ-කුරුණෑගල (කා.දැ.පි)
4. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්-කුරුණෑගල (කා.දැ.පි.)
5. දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ - කුරුණෑගල (කා.දැ.පි)
6. ප්‍රාදේශීය ලේකම්තුමිය- පොල්පිතිගම (කා.දැ.පි)
7. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ-ගල්ගමුව (කා.දැ.පි)
8. සහකාර අධ්‍යක්ෂ -පොහොර ලේකම් කාර්යාලය (කා.දැ.පි)
9. වාරිමාර්ග ඉංජිනේරුතුමා - ඉබ්බාගමුව (කා.දැ.පි)
10. ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිළධාරීතුමා-රඹේ (කා.දැ.පි)
11. සහකාර අධ්‍යක්ෂ-කෘෂිරක්ෂණ මණ්ඩලය- කුරුණෑගල (කා.දැ.පි)
12. මූලස්ථාන කෘෂිකර්ම උපදේශකතුමා- රඹේ (කා.දැ.පි)
13. ජනපද නිලධාරීතුමා - පොල්පිතිගම (කා.දැ.පි)
14. පරිපාලන ග්‍රාමනිලධාරීතුමා - පොල්පිතිගම (කා.දැ.පි)
15. සියලුම අදාල වසම්වල කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහත්ම මහත්මීන් (කා.දැ.පි)
16. සියලුම ගොවි සංවිධාන නිළධාරී මහත්ම මහත්මීන්-හක්වටුනාඔය ව්‍යාපාරය (කා.දැ.පි)